**මැදදුම්බර ප්‍රාදේශීය සභාව - 2022**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ කුලී ආදායම රු.3,487,761 ක් වුවත් රු.4,302,773 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් කුලී ආදායම රු.815,012 ක් වැඩියෙන් දැක්විණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ බලපත්‍ර ආදායම රු.2,522,735 ක් වුවත් රු.324,250 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් රු.2,198,485 ක් බලපත්‍ර ආදායම අඩුවෙන් දැක්විණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ ත්‍රීරෝද රථ ආදායම රු.753,520 ක් වුවද රු.409,045 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් රු.344,475 ක් අඩුවෙන් දැක්විණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ ජල ගාස්තු ආදායම රු.3,187,027 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම රු.12,305,701 ක් වුවද, රු.34,495,373 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් රු.22,189,672 ක් වැඩියෙන් දැක්විණි. | ලැබුණු මුද්දර ගාස්තු ගිණුම්ගත කර ඇති බව. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂ හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ සමඟ සැසඳීමේදී රු.24,227,865 ක වෙනසක් පැවතුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.3,452,453 ක් වූ ගිණුම් ශේෂ 03 ක් අයිතිය තහවුරු කිරීමේ ලියවිලි, ශේෂ සනාථන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා සහ භෞතික පැවැත්ම නොතිබීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නීත්‍යානුකූලව නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගැනීමටත්, සමීක්ෂණ වාර්තා හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 19 (1) (x, xi) | සභා සතු ඉඩම් බැහැර කළ නොහැකි බව දැක්වුවද තෙල්දෙණිය රෝහල් වට රවුම් පාර පිහිටි භූමිය තුළ පෞද්ගලික කඩ කාමර ඉදිකිරීමට ඉඩහැර තිබුණි. | ගිවිසුම්ගතව මේ වන විට බදු කුලී අය කරන බව. | අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතුය. |
| | (ii) 149 වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 02 කින් සියයට 1 ක ව්‍යාපාර බදු අයකර නොතිබුණු අතර 2016 හා 2017 දක්වා කාලයට අදාළ ලැබිය යුතු රු.315,264 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී නීති මඟින් කටයුතු කරන බව. | නියමිත ගාස්තු අය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | 2019 සිට 2020 දක්වා කාලය තුළ රු.190,550 ක කාලය ඉකුත් වූ තැන්පත් 134 ක් නියාදනය කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ නිදහස් කිරීමට හෝ රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය 5(1) වගන්තිය | වසර 05 කට වරක් කඩ කාමර කුලී සංශෝධනය කළ යුතු වුවත්, තෙල්දෙණිය ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර 25 ක් 2015 වර්ෂයෙන් පසුව තක්සේරු කර නොතිබුණි. | නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,917,402 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,588,403 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,772,630 | 2,113,297 | 2,494,108 | 1,021,640 | 1,571,638 | 1,564,249 | 1,363,258 | 1,402,451 |
| (ii) | කුලී | 1,272,339 | 3,668,192 | 5,554,029 | 2,256,340 | 4,400,048 | 3,236,717 | 3,364,425 | 4,142,177 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,544,196 | 2,526,735 | 2,685,485 | 48,050 | 3,733,846 | 2,018,450 | 2,208,100 | 206,800 |
| (iv) | වෙනත් ආදායම් | 69,704,926 | 55,664,536 | 56,834,801 | 65,021,810 | 71,563,539 | 48,999,680 | 50,858,292 | 66,192,075 |
| | | 76,294,091 | 63,972,760 | 67,568,423 | 68,347,840 | 81,269,071 | 55,819,096 | 57,794,075 | 71,943,503 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.911,318 ක් වූ අතර ඉන් ඒකකයක වරිපනම් හිඟය රු.5,000 ඉක්මවූ දේපල 53 කින් එකතුව රු.638,189 ක් විය. | දේපල තහනම් කිරීම සඳහා විනිග්‍රහ බලපත්‍ර නිකුත් කර ඇති බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| **(ආ) කඩ කුලී** | | |
| තෙල්දෙණිය රෝහල් වටරවුම් පාරේ පිහිටි කඩ කාමර 06 ක් සඳහා 2019 අගෝස්තු 26 දින තක්සේරු වාර්තාව අනුව කුලී අය කිරීම 2021 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2021 පෙබරවාරි මස සිට 2022 දෙසැම්බර් මස දක්වා කාලය තුළ සභාවට රු.1,160,074 ක පාඩුවක් සිදුවී තිබුණි. | තක්සේරු වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා ඇති බව. | නව තක්සේරුව අනුව කඩ කුලී අයකළ යුතුය. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.635,524 ක් හා මුද්දර ගාස්තු රු.21,531,744 ක් විය. | ප්‍රධාන ලේකම් කාර්යාලය දැනුවත් කර ඇති බව. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක එකතුව රු.13,370,887 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.4,542,105 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.4,472,290 ක් විය. | අයකර ගැනීමට, කපා හැරීමට හා විධිමත් සමීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.13,016,479 ක් වූ අතර ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.4,278,102 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.3,267,886 ක් විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කෙරෙන අතර අනෙකුත් ණය නිරවුල් කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| අවිගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.17,850,000 ක වාහන 07 ක් හා රු.177,500 ක ජල බවුසරයක් වසර 02 සිට 09 දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | අලුත්වැඩියා කර භාවිතයට ගන්නා බව. | අලුත්වැඩියා කර ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව පරිහරණය කරන කැබ් රථයක හා ජීප් රථ 02 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරාගත යුතුය. |

**3.4 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තෙල්දෙණිය පොදු වෙළඳපල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2009 ජූනි 09 දින අනුමත කර ගෙන තෙල්දෙණිය සතිපොල භූමියේ වෙළඳාමේ නිරතව සිටි වෙළඳුන් 76 දෙනෙක් හඳුනාගෙන ඔවුන්ට ඉදිකිරීමට නියමිත වෙළඳ සංකීර්ණයේ වෙළඳසැල් ලබාදීමට තීරණය වී තිබියදී වෙනත් වෙළඳුන් 94 දෙනෙකුට වෙළඳසැල් ලබාදීමට 2013 මැයි 22 දින සභාව තීරණය කර තිබුණි. පසුව හඳුනාගත් බදුකරුවන් 93 දෙනෙකුගෙන් රු.20,501,000 ක තැන්පත් මුදලක් සභාව ලබාගෙන තිබුණු අතර ප්‍රථමයෙන් හඳුනාගත් වෙළඳුන් සභාවට එරෙහිව නඩු පවරා තිබීමෙන් එම කඩ කාමර ඉදිකිරීම නවතා දමා තිබුණි. යෝජිත කඩ කාමර සම්බන්ධයෙන් සභාවට එරෙහිව නඩු 09 ක් දැනට ක්‍රියාත්මකව පවතින අතර, වසර 09 ක කාලයක් තුළ නීතිඥ ගාස්තු ලෙස රු.1,901,600 ක මුදලක් සභා අරමුදලින් දරා තිබුණි. | අදාළ මුදල් අයකර දෙන ලෙස නීතිඥවරයා දැනුවත් කර ඇති බව. | නඩු තීරණ අනුව කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 11 ක පුරප්පාඩු 24 ක් ද එක් තනතුරුක අතිරික්තතා 10 ක් ද පැවතුණි. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් අත්හිටුවා ඇති අතර රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව සංවර්ධන නිලධාරී තනතුර සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමෙන් අතිරික්තව ඇති බව. | අනුමත කාර්යමණ්ඩලය අනුව අදාළ කටයුතු කළ යුතුය. |
| **(ආ) සේවක ණය** | | |
| 1993 ජූලි හා 2021 දෙසැම්බර් මස ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.209,358 ක් ද 2004 වර්ෂයේ සිට පැවත එන සේවකයින් 05 දෙනෙකුගේ රු.17,736 ක් හා 2021 වර්ෂයේ විශ්‍රාම ගොස් සිටි සේවකයින් දෙදෙනෙකුගේ රු.1,650 ක ණය ශේෂයක් අයකර නොතිබුණි. | පළාත් භාණ්ඩාගාරය දැනුවත් කර ඇති බව. | ණය ශේෂ අයකරගත යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් සඳහා තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 23 ක සියයට 32 සිට සියයට 100 දක්වාද, වියදම් විෂයයන් 25 ක සියයට 20 සිට සියයට 100 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් අයවැය ලේඛනය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සළකා අයවැය පිළියෙල කළ යුතුය. |

**4.2 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂවලදී අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කරන බව. | තිරසර සංවර්ධන දර්ශක හඳුනාගෙන අරමුණු හා ඉලක්ක ඉටුකර ගත යුතුය. |